# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2154/11 - 2019 දෙසැම්බර් මස 18 වැනි බදාදා - 2019.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය : KDS/UDP/4/1/LAQ*
*ENTR.MORAGO.05.*
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය: 4-3/2/2017/CEB/201.*

***ගම්පොල මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතියේ බලාගාර පිවිසුම් මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම***

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවේ විස්තර :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර ඉහළ කෝරළේ ගලත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මැණුම්පති විසින් මැන පිළියෙල කරන ලද අංක 320229 (6) 3 දරන කැඩැස්තර සිතියමේ කැබලි අංක 25 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.4111 ක් සහ කැබැලි අංක 26 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.8859 වන දේවිට මැද්දෙලියහේන නම් ඉඩම් කොටස්.

වන්දි පරීක්ෂණ දිනයන් හා වේලාව :

01. **කැබලි අංක 25**
කැඩැස්තර සිතියම් අංකය: සි.එම්.320229 (6) 3; වන්දි පරීක්ෂණ දිනය: 2020.01.30; වේලාව: පෙ.ව.10.00; ස්ථානය: ගම්පොල උඩපළාත, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

02. **කැබලි අංක 26**
කැඩැස්තර සිතියම් අංකය: සි.එම්.320229 (6) 3; වන්දි පරීක්ෂණ දිනය: 2020.01.30; වේලාව: පෙ.ව.10.00; ස්ථානය: ගම්පොල උඩපළාත, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම්, හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාටම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2020.01.30 වැනි දින පූ.භා.10.00ට උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020.01.16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී


1A - G 31657 - 34 (2019/12)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ආර්.ඒ.ඩී.ටී.එන්.තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්, උඩපළාත කොට්ඨාසය,
ගම්පොල.

2019 දෙසැම්බර් මස 12 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

01-129

---

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය : J/DS/2/9/4/02-2017*
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අංකය : 4-3/15/2017/VE/205.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවේ විස්තර :*

මූලික පිඹුරු අංකය: PPYA 2948; ඉඩම: කොලුම්බුතුතුරෙයි (වාට්ටු අංක. 8 යාපනය මහනගර සභා සීමාව තුළ); ග්‍රාම සේවා වසම: J/61, නෙඩුංකුලම්; ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: යාපනය; දිස්ත්‍රික්කය: යාපනය; පළාත: උතුරු පළාත; හේතුව: ග්‍රාම විස්තර ව්‍යාපෘතිය.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: කොලුම්බුතුතුරෙයි තෙන්නම් තෝට්ටම් වරි අංක 551 (කොටසක්) කොලුම්බුතුතුරෙයි පාර; ඉඩම් පරිමාණය: වත්තක් සහ ලිඳක්; හිමිකම් කියන්නා: කුමුතා විවෙකානන්තන් සහ කලෛමකල් ලින්කේස්වරන්; බිම් ප්‍රමාණය : හෙක්ටයාර 1.0117

ඉහත සඳහන් ඉඩම/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම්, හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.01.30 වැනි දින පූ.භා. 10.00ට යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020.01.16 වැනි දිනට මත්තෙන් ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම්/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තර, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්.සුතර්සන්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
යාපනය.

2019 දෙසැම්බර් මස 13 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
යාපනය.

01-130

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.